සැ. යු.– 2007.08.10 වැනි දින පළකරන ලද 1,510 දරන *ගැසට් පත්‍රයෙහි* IV (අ) කොටස සහ II කොටස පළ නොකරන ලදී.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,511 - 2007 අගෝස්තු 17 වැනි සිකුරාදා - 2007.08.17

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | 864 |
| ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... .. | 867 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | 875 |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් .. ... ... | 877 |
| විවිධ දැන්වීම් ... ... ... | — |

සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ

### වැදගත් නිවේදනයයි

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මීන් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැලසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මීන් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2007 අගෝස්තු මස 24 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2007 අගෝස්තු මස 10 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

**ලක්ෂමන් ගුණවර්ධන**,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2007 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

## 2008 වර්ෂය සඳහා කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රා තැබෑරුම් රේන්ද විකිණීම

2008 ජනවාරි මස 01 වැනි දින සිට 2008 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලය තුළ පහත සඳහන් උපලේඛනයෙහි දක්වා ඇති රා තැබෑරුම්වල පැසුණු රා සිල්ලරට විකිණීමේ සම්පූර්ණ වරප්‍රසාදය මිල දී ගැනීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 207 දරන *ගැසට් පත්‍රයේ* සුරාබදු කොමසාරිස්වරයා විසින් පළ කරන ලද රා විකිණීමේ කොන්දේසිවලට ද, යටත්ව 2007 සැප්තැම්බර් මස 18 වැනි දින පෙ. ව. 10.30 දක්වා කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් විසින් ටෙන්ඩර්පත් භාරගනු ලැබේ.

රා රේන්ද මිලදී ගැනීමට ඉදිරිපත් වන අය නියමිත ආකෘති පත්‍ර නිසි පරිදි සම්පූර්ණ කොට, මෙහි පහත දැක්වෙන උපලේඛනයෙන් නියම කර ඇති ටෙන්ඩර් තැන්පත් මුදල ගෙවා ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක සරප් ශබාවකින් ලබා ගත් කුවිතාන්සියක් ද, ඉහත දක්වා ඇති *ගැසට් නිවේදනයේ* වන රා විකිණීමේ කොන්දේසිවල දැක්වෙන පරිදි ලබාගත් වත්කම් සහතිකයක් ද, සහිතව කවරයක බහා, එය මුද්‍රා තබා එහි මුදුනේ වම් කෙළවරේ තමන් ටෙන්ඩර් කරන රා තැබෑරුමේ අංකය සහ නම ද, පැහැදිලිව ලියා උපලේඛනයේ දැක්වෙන අවසාන වේලාවට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවීමෙන් හෝ මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මේ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන් කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් වෙත ලැබෙන්නට සැලැස්විය යුතුය. නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍ර ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත හැකිය.

ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර්පත් සම්පූර්ණ කිරීමේ දී ටෙන්ඩර් පත්‍රවල කරනු ලබන සෑම වෙනස් කිරීමක් සඳහා ම ටෙන්ඩර්කරුගේ සම්පූර්ණ අත්සන යෙදීමෙන් සනාථ කළ යුතුය. එසේ නොවන ටෙන්ඩර්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය 2007 සැප්තැම්බර් මස 18 වැනි දින පෙ. ව. 10.30 ට තෙක් පමණි. සියලුම ටෙන්ඩර්කරුවන් මෙදින එම වේලාවට මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

කිසිම කරුණු දැන්වීමක් නොකොට ටෙන්ඩර් පත්‍රිකාවක් හෝ ටෙන්ඩර් පත්‍රිකා සියල්ල ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් සතු වේ.

තනි වරප්‍රසාද මිලදී ගත් තැනැත්තා යැයි ප්‍රකාශයට පත් කිරීමෙන් පසු සාර්ථක ටෙන්ඩර්කරු විසින් එසේ ප්‍රකාශ කරන ලද දින ප. ව. 2.00 ට කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලබන මුදලක් ආරක්ෂිතව ඇප තැන්පත් වශයෙන් ගෙවා විකුණුම් කොන්දේසිවලට අත්සන් කළ යුතුය.

2008 වර්ෂය සඳහා දැනට රා තැබෑරුම් ඇති ස්ථානය ලබා දීමට සහතික වනු නොලැබේ. දැනට රා තැබෑරුම පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ල 2008 වර්ෂය සඳහා නොලැබෙන්නේ නම් ඒ වෙනුවට තෝරාගත් අලුත් ස්ථානයේ යෝග්‍යතාවය පිළිබඳව ටෙන්ඩර ප්‍රදානය කළ දින සිට දින 30ක් ඇතුළත සාර්ථක ටෙන්ඩර්කරු විසින් ඒ සඳහා කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කුරුණෑගල ගෙන් අනුමැතිය ද ලබා ගත යුතුයි.

2007 සැප්තැම්බර් මස 18 වැනි දින රේන්දය විකිණීමෙහිලා සතුටුදායක ඉල්ලීම් නොතිබුනහොත් 2007 ඔක්තෝබර් මස 17 වැනි දින පෙ. ව. 10.30 ට නැවත රේන්දය විකිණීම මෙම ස්ථානයේදී ම පවත්වනු ලැබේ.

වැඩි විස්තර අවශ්‍ය වේ නම් කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගත හැකිය.

ඩබ්ලිව්. එම්. ජයවර්ධන,
ප්‍රාදේශීය ලේකම්,
කුරුණෑගල.

2007 අගොස්තු මස 02 වැනි දින,
කුරුණෑගල ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ දී ය.

උපලේඛනය

කුරුණෑගල ප්‍රදේශීය ලේකම් කොට්ඨාශයේ අනුමත රා තැබෑරුම - 2008

| *අංකා හා නම* | *පත්තුව* | *තැබෑරුම විවෘත කළ යුතු ප්‍රදේශය* | *ටෙන්ඩර් තැන්පත් මුදල* | *ටෙන්ඩර් වසන දිනය හා වේලාව* | *තැබෑරුම විවෘත කළ යුතු වේලාව* | *තැබෑරුම වැසිය යුතු වේලාව* |
|---|---|---|---|---|---|---|
| අංක 02 කුරුණෑගල | වැඋඩවිල්ලි හත්පත්තුව | නාගරික කොට්ඨාශ අංක 01, 09, 10 11 සහ 12 | රු. 3,000 | 2007.09.18 පෙ.ව. 10.30 | පෙ.ව.11.00 සහ ප.ව. 5.00 | ප.ව. 2.00 සහ ප.ව.8.00 |

08-595

## 2008 වර්ෂය සඳහා පන්නල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රා තැබෑරුම් රේන්ද විකිණීම

2008 ජනවාරි 01 සිට 2008 දෙසැම්බර් 31 දක්වා වූ කාලය තුළ පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති රා තැබෑරුමේ පැසුණු රා සිල්ලරට විකිණීමේ සම්පූර්ණ වරප්‍රසාද මිලදී ගැනීම සඳහා, 1982 අගෝස්තු මස 20 වන දින නිකුත් කරන ලද, අංක 207 දරන *ගැසට් පත්‍රයේ* සුරාබදු කොමසාරිස් වරයා විසින් පල කරන ලද, රා විකිණීමේ කොන්දේසි වලටද යටත්ව 2007 සැප්තැම්බර් මස 17 වන දින පෙ.ව. 10.30 දක්වා පන්නල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් විසින් ටෙන්ඩර් පත් භාර ගනු ලැබේ.

02. රා රේන්ද මිළ දී ගැනීමට ඉදිරිපත් වන අය ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබා ගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක් නිසි පරිදි සම්පූර්ණ කර, මෙහි පහත දැක්වෙන ටෙන්ඩර් උප ලේඛනයෙන් නියම කර ඇති ටෙන්ඩර් තැන්පත් මුදල ගෙවා ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක සරප් ශාඛාවකින් ලබාගත් කුවිතාන්සියක්ද, ඉහත දක්වා ඇති *ගැසට් නිවේදනයේ* වන රා විකිණීමේ කොන්දේසිවල දැක්වෙන පරිදි, ලබා ගත් වත්කම් සහතිකයක්ද සහිතව කවරයක බහා, එයට මුද්‍රා තබා, එහි මුදුනේ වම් කෙළවරේ තමන් ටෙන්ඩර් කරන තැබෑරුමේ අංකය සහ නමද, පැහැදිලිව ලියා, උපලේඛනයේ දැක්වෙන අවසාන වේලාවට පෙර ලැබෙනසේ ලියාපදිංචි තැපෑලෙන් එවීමෙන් හෝ මෙම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ මේ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන් පන්නල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් වෙත ලැබෙන්නට සැලැස්විය හැක.

03. ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර්පත් සම්පූර්ණ කිරීමේ දී ටෙන්ඩර්පත්‍රවල කරනු ලබන සෑම වෙනස් කිරීමක්ම සම්පූර්ණ අත්සන යෙදීමෙන් සනාථ කළ යුතුය. එසේ නොවන ටෙන්ඩර්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය වන 2007.09.17 වන දින පෙ.ව. 10.30 ට සියළුම ටෙන්ඩර්කරුවන් මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙහි පෙනී සිටිය යුතුය.

05. කිසිම කරුණු දැන්වීමක් නොකොට ටෙන්ඩර්පත්‍රිකාවක් හෝ ටෙන්ඩර්පත්‍ර සියල්ල ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය පන්නල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් සතුවේ.

06. තනි වරප්‍රසාද මිලදී ගත් තැනැත්තා යයි ප්‍රකාශයට පත් කිරීමෙන් පසු, සාර්ථක ටෙන්ඩර්කරුවකු විසින් එසේ ප්‍රකාශ කල දින ප.ව. 2.00 ට පෙර පන්නල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලබන මුදලක් ආරක්ෂිත ඇප තැන්පත් වශයෙන් ගෙවා විකුණුම් කොන්දේසි වලට අත්සන් කළ යුතුය.

07. 2008 වර්ෂය සඳහා දැනට රා තැබෑරුම ඇති ස්ථානය ලබා දීමට සහතික වනු නොලැබේ. දැනට රා තැබෑරුම පවත්වා ගෙන යනු ලබන ගොඩනැගිල්ල නොලැබෙන්නේ නම්, ඒ වෙනුවට තෝරා ගත් අලුත් ස්ථානයේ යෝග්‍යතාවය පිළිබඳ ටෙන්ඩර් ප්‍රදානය කළ දින සිට දින 30 ක් ඇතුළත සාර්ථක ටෙන්ඩර්කරු විසින් ඒ සඳහා පන්නල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්ගෙන් අනුමැතිය ලබා ගත යුතුය.

08. 2007.09.17 දින රේන්ද විකිණීමේ දී සතුටුදායක ඉල්ලීම් නොලැබුනහොත් 2007.10.16 දින පෙ.ව. 10.30 ට නැවත රේන්ද විකිණීම මෙම කාර්යාලයේ දී පවත්වනු ලැබේ.

09. වැඩි විස්තර අවශ්‍ය වන්නේ නම් මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගත හැකිය.

ඩබ්. එම්. දීප්ති ප්‍රනාන්දු,
ප්‍රාදේශීය ලේකම්/පන්නල.

2007 ජුලි මස 17 වෙනි දින,
පන්නල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

උපලේඛනය

### පන්නල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අනුමත රා තැබෑරුම - 2008 වර්ෂය

| *අංකය හා නම* | *පත්තුව* | *තැබෑරුම විවෘත කළ යුතු ප්‍රදේශය* | *ටෙන්ඩර් තැන්පත් මුදල* | *ටෙන්ඩර් වසන දිනය හා වේලාව* | *තැබෑරුම විවෘත කළ යුතු වේලාව* | *තැබෑරුම වැසිය යුතු වේලාව* |
|---|---|---|---|---|---|---|
| 01 ගිරිඋල්ල | කටුගම්පල හත්පත්තුව | මාහරගම/හාල්පනේ ගම තුළ (අංක 1566 මාහරගම) ග්‍රාම නිළධාරි වසම | රු. 1000 | 2007.09.17 පෙ.ව.10.30 | පෙ.ව. 11.00 සහ ප.ව. 5.00 | ප.ව.2.00 සහ ප.ව.8.00 |

08-472

## 2008 වර්ෂයට හම්බන්තොට දිස්ත්‍රික්කයේ රා රේන්ද විකිණීම

2008 ජනවාරි මස 01 වන දින සිට 2008 දෙසැම්බර් 31 දක්වා කාලය තුළ පහත උපලේඛනයේ විස්තර සඳහන් රා තැබෑරුමේ පැසුනු රා සිල්ලරට විකිණීම සඳහා 1982.08.20 දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජන රජයේ *ගැසට් පත්‍රයේ* පල කරන ලද රා රේන්ද විකිණීමේ කොන්දේසිවලට හා පොදුවේ සෑම සුරාබදු බලපත්‍රයක්ම වෙනුවෙන් දැනට බලපවත්නා හා ඉදිරියට බලපැවැත්විය හැකි කොන්දේසිවලට යටත්ව හම්බන්තොට දිස්ත්‍රික්කයේ පිහිටි අංක 01 දරන රා තැබෑරුම සඳහා ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ.

02. ටෙන්ඩර් තැන්පත් මුදල් වශයෙන් රු. 5000 ක් ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට තැන්පත් කර ලබා ගත් නියමිත පෝරමය ඉදිරිපත් කල යුතුය. තවද ටෙන්ඩරකරු විසින් පහත සඳහන් *ගැසට් නිවේදනයේ* පරිදි වත්කම් සහිත සහතික ටෙන්ඩර්කරුගේ නිශ්චල දේපල පිහිටි ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබාගෙන ටෙන්ඩර් පත්‍රයට ඇමිණිය යුතුය.

03. සෑම ටෙන්ඩරයක්ම ටෙන්ඩර්කරුගේ නමින් ඉදිරිපත් කල යුතුය. නියෝජිතයෙකු විසින් හෝ ලාංකික නොවූ හා 1982.08.20 දින අංක 207 දරන *ගැසට් පත්‍රයේ* පල කරන ලද 1982 වර්ෂයේ රා රේන්ද විකිණීමේ කොන්දේසි යටතේ නුසුදුසු වන්නන්ගේ ටෙන්ඩර් පත්‍ර භාර ගනු නොලැබේ.

04. මෙම තැබෑරුම වෙනුවෙන් එක් අයෙකු විසින් එක් ටෙන්ඩරයකට වඩා ඉදිරිපත් කල නොහැකි අතර පස් දෙනෙකුට වඩා හවුල් වන ටෙන්ඩර් පත්‍ර ද ඉදිරිපත් කල නොහැක.

05. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම කවරක බහා සීල් තබා කවරයේ වම් පස මුදුනේ "හම්බන්තොට දිස්ත්‍රික්කයේ අංක 01 දරන රා තැබෑරුමේ රේන්ද සඳහා ටෙන්ඩර් - 2008" යනුවෙන් පැහැදිලි ලෙස සඳහන් කල යුතුය. ටෙන්ඩර් සහිත කවරය හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන් හෝ ලියාපදිංචි තැපෑලෙන් 2007.09.11 වන දින පෙ.ව. 10.00 ඉකුත් වීමට පෙර ලැබෙන සේ ඉදිරිපත් කල යුතුය. ටෙන්ඩර් වසන වේලාවේ දී සියළුම ටෙන්ඩර්කරුවන් හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට පැමිණ සිටිය යුතුයි.

06. සාර්ථක වූ ටෙන්ඩර්කරු විසින් ඔහුගේ ටෙන්ඩර් පත්‍රය පිළිගත් බව දැන් වූ විට රේන්දය විකිණීමේ කොන්දේසිවලට අත්සන් කර හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් විසින් ඇප තැන්පත් වශයෙන් නියම කරනු ලබන මුදලක් ගෙවිය යුතුයි.

07. ටෙන්ඩර් පත්‍රයේ හෝ සියලුම ටෙන්ඩර් පත්‍ර හෝ නියමිත හේතුන් නොදන්වා ප්‍රතික්ෂේප කිරීමේ සම්පූර්ණ බලය හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් වෙත පැවරී ඇත.

08. කිසියම් හේතුවක් නිසා ටෙන්ඩර් භාර ගැනීමට නියමිත 2007.09.11 වන දිනට අවලංගු කිරීමට සිදුවුවහොත් නැවත ටෙන්ඩර් භාර ගන්නා දිනය 2007.10.12 වන දින වේ.

09. වැඩි විස්තර හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් දැන ගත හැකිය.

ඩී. එස්. පත්මකුලසූරිය,
ප්‍රාදේශීය ලේකම්,
හම්බන්තොට.

2007 ජූලි මස 23 වැනි දින,
හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

උපලේඛනය

### 2008 වර්ෂයට හම්බන්තොට දිස්ත්‍රික්කයේ අනුමත කරන ලද රා තැබෑරුම

| *අනුක්‍රමික* | *කොට්ඨාසය* | *ග්‍රාමය* | *ටෙන්ඩර්පත් භාර ගැනීම* | *තැබෑරුම විවෘතව තැබිය යුතු වේලාවන්* |
|---|---|---|---|---|
| 01 | හම්බන්තොට | හම්බන්තොට | 2007.09.11<br>පෙ.ව.10.00 | පෙ.ව.11.00 සිට<br>ප.ව. 2.00 දක්වා සහ<br>ප.ව. 5.00 සිට<br>ප.ව. 8.00 දක්වා |

08-473

# ආණ්ඩුවේ නොවන දැන්වීම්

## ඇටර්නි බලය අවලංගු කිරීම

දෙල්ගොඩ, මීගහවත්ත, පුංචිමහහේනේ, අංක 217/10/01 දරන ස්ථානයේ පදිංචි හේමන්ත මහීලාල් බෝපිටියගමගේ වන මා විසින් ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ජී. එම්. පුංචිබණ්ඩා ගල්ලබ විසින් වර්ෂ 1999 ක් වූ ජනවාරි මස 09 වන දින ලියා සහතික කළ අංක 297 දරන ඇටර්නි බලපත්‍රය මගින් මහරගම, දහම් මාවතේ, අංක 57/2 දරන ස්ථානයේ පදිංචි රුක්මාල් නිශාන්ත බෝපිටියගමගේ යන අය වෙත පවරන ලද ඇටර්නි බලය මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කොට අහෝසි කොට අවලංගු කරනු ලැබේ.

එකී ඇටර්නි බලකරු විසින් මින් ඉදිරියට මාගේ ඇටර්නි බලකරු වශයෙන් කරනු ලබන කිසිම කටයුත්තකට මා විසින් වග කියනු නොලැබේ.

හේමන්ත මහීලාල් බෝපිටිය ගමගේ.

වර්ෂ 2007 ක් වූ මස 01 දින දී ය.

08-606

---

## සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 9 (1) වගන්තිය ප්‍රකාර මෙම සමාගම, රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් ලියාපදිංචි කර ඇති බැව් මෙයින් දන්වමි.

සමාගමේ නම : සීමාසහිත (ජනතා) පහළ ආඳළුව ගැමිදිරිය සමාගම
සමාගමේ ලියාපදිංචි අංකය හා දිනය : පී. බී. 3187 - 2007.07.13
ලියාපදිංචි ලිපිනය : පහළ ආඳළුව, කොළඹගෙආර.

සමාගම් ලේකම්.

2007 ක් වූ ජූලි මස 16 වැනි දින දීය.

08-623

---

## සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 9(1) වගන්තිය ප්‍රකාර මෙම සමාගම, රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් ලියාපදිංචි කර ඇති බැව් මෙයින් දන්වමි.

සමාගමේ නම : සීමාසහිත (ජනතා) කණබැදිආර ගැමිදිරිය සමාගම
සමාගමේ ලියාපදිංචි අංකය හා දිනය : පී. බී. 3254 - 2007.07.25.
ලියාපදිංචි ලිපිනය : කණබැදිආර, ඇඹිලිපිටිය.

සමාගම් ලේකම්.

2007 ක් වූ ජූලි මස 16 වැනි දින දීය.

08-624

---

## ක්ලීන්කෝ ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය යටතේ සංස්ථාගත කිරීම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීම

2007 ජූලි 24 වන දින දී සමාගම ලියාපදිංචි අංක පීවී 60768 යටතේ ක්ලීන්කෝ ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් යන නාමය යටතේ නව සමාගමක් සංස්ථාගත කරනු ලැබ ඇති බව සහ නව සමාගමේ කාර්යාලයීය ලිපිනය කොළඹ 10, ටී. බී. ජායා මාවත, අංක 334, හි බව අපි මෙයින් මහජනතාවට දැනුම් දෙමු.

ඊඑම්ඇන්ඩ් ඊඑන් සෙක්‍රටරීස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
(සමාගමේ සමාගම් ලේකම්වරු),

එම්. ඇන්ඩ් එන්. ගොඩනැගිල්ල,
(5 වන තලය),
අංක 2, ඩීල් පෙදෙස,
කොළඹ 03.

08-613

---

## අටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ හෝමාගම, අතුරුගිරිය පාර, අංක 871/10 හි පදිංචි යටිඕවිට විතාරනලාගේ ප්‍රේමලාල් බන්දුල සෙනෙවිරත්න වන මා විසින් හෝමාගම, අතුරුගිරිය පාර, අංක 871/10 හි පදිංචි ලක්ෂ්මී චන්ද්‍රනී ගුණවර්ධන යන අයට දී ඇති අංක 1134 සහ 2005.06.07 දින ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. එම්. ජී. බී. විජයරත්න විසින් ලියා සහතික කරන ලද ඇටෝර්නි බලපත්‍රය 2007.08.04 දින සිට අවලංගු කරන ලද බව ශ්‍රී ලංකා ජනරජයට හා ජනතාවට දන්වා සිටිමි.

යටිඕවිට විතාරනලාගේ ප්‍රේමලාල් බන්දුල සෙනෙවිරත්න.

08-578

---

## ඇටෝර්නි බලය අහෝසි කිරීම

කඩවත ඉහළ බියන්විල අංක 651240174 **V** දරන ජාතික හැඳුනුම්පත හිමි සුසිල් දයාරත්න රණසිංහ විසින් ශ්‍රී ලංකා ජනරජයේ කඩවත ඉහළ බියන්විල දී ලක්ෂ්මන් කුමාරදාස රණසිංහ වෙත 2004 ජුනි මස 04 වෙනිදා ප්‍රදානය කරන ලද ගෝනහේනේ ඊ. ඒ. හේමචන්ද්‍ර විසින් සහතික කරන ලද අංක 6110 දරන අටෝර්නි බලපත්‍රය 2007 ජූලි 07 වෙනි දින සිට බලපැවැත්වෙන පරිදි අවලංගු කර හා බලරහිත කර ඇති බවත්, එම දිනයේ සිට මොනයම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ලක්ෂ්මන් කුමාරදාස රණසිංහ කිසිම වගකීමක් හෝ බැඳීමක් නොදරන බවත් ශ්‍රී ලංකා ජනරජයට හා මහජනතාවටත් මෙයින් දන්වා සිටිමි.

සුසිල් දයාරත්න රණසිංහ.

08-577

## නිවේදනයයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය යටතේ කැන්තස් මැනේජ්මන්ට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ් යන සමාගම සීමාසහිත පෞද්ගලික සමාගමක් වශයෙන් වර්ෂ 2007 ක් වූ ජූලි මස 06 වන දින ලියාපදිංචි කරන ලදී.

සමාගමේ නම : ඔමෝ (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී. 60569
සමාගමේ ලියාපදිංචි කාර්යාලය : බොලොක් 1, ඉන්ඩස්ට්‍රියල් වත්ත (එස්ටේට්), පුත්තොට්ටම්, වවුනියා

අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිව ඇතුළුව,

බ්‍රිලියන්ට් ප්‍රමෝටර්ස් ඇන්ඩ් කන්සල්ටන්ස්,
ප්‍රයිවට් ලිමිටඩ්,
ලියාපදිංචි ලේකම්වරු.

08-511

---

## මහජනතාව වෙත නිවේදනයයි

බී ඇන්ඩ් එස් ටෙක් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වන වගන්තිය යටතේ මෙසේ මහජනතාව වෙත නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : බී ඇන්ඩ් එස් ටෙක් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්.
ලියාපදිංචි කාර්යාලය : 150/31, කිඹිරිගස්යාය පාර, කොළඹ 05.
ලියාපදිංචි අංකය : PV60599.

08-579

---

## දැන්වීමයි

2007 වසරේ අංක 07 දරන සමාගම් පනතේ 9 වගන්තියට අනුව, පහත සඳහන් සමාගම නීත්‍යානුකූල සමාගමක් ලෙස ලියාපදිංචි කළ බව අප විසින් මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : ඉවෙන් **X** ප්‍රොඩක්ෂන් හවුස් (පෞද්ගලික) සමාගම,
47, ඇලෙක්සැන්ඩ්‍රා පෙදෙස, කොළඹ 07,
සමාගමේ අංකය : PV 60678,
ලියාපදිංචි කළ කාර්යාලයේ ලිපිනය : 47, ඇලෙක්සැන්ඩ්‍රා පෙදෙස, කොළඹ 07,
ලියාපදිංචි කළ දිනය : 2007 ජූලි මස 17 දින.

සමාගම් ලේකම්වරු, සංස්ථා උපදේශන
සේවා (පෞද්ගලික) සමාගම.

08-550

---

## සමාගමක් සංස්ථාපිත කිරීමේ ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් ආඥා පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර කරනු ලබන නිවේදනනයි.

පහත සඳහන් සමාගම් සංස්ථාපනය කර ඇති බව මෙයින් දැනුම්දෙමු.

සමාගමේ නම :
සීමාසහිත අශාන් ඇන්ඩ් අසංක හෝල්ඩිංග්ස් (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය : පී. වී. 60551 දාතම : 2007.07.05
සමාගමේ ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : 25/1, නාවල පාර, නුගේගොඩ.

සමාගමේ නම : සීමාසහිත සේවානිම ඩිස්ට්‍රිබියුටර්ස් (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය : පී. වී. 60682 දාතම : 2007.07.17
සමාගමේ ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : 23/ඒ, සුබෝධාරාම පාර, දෙහිවල.

සමාගමේ නම : සීමාසහිත රිසිල්ටා හෝල්ඩිංස් (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය : පී. වී. 60703 දාතම : 2007.07.18
සමාගමේ ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය :
06, කීල්ස් හවුසින් ස්කීම්, කලල්ගොඩ, පන්නිපිටිය,

සමාගමේ නම : සීමාසහිත අනීශා ඇපරල්ස් (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය : පී. වී. 60742 දාතම : 2007.07.23
සමාගමේ ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : 54/2, ශ්‍රී රාහුල මාවත, කටුබැද්ද, මොරටුව.

සීමාසහිත එකවුන්ටන්සි ඇන්ඩ් සෙකටේරියල්
සර්විසස් බියුරෝ සමාගම
ලේකම්වරු,

අංක 86, එස්. ද. එස්. ජයසිංහ මාවත,
කොහුවල, නුගේගොඩ.
2007 ජූලි මස 25 වැනි දින.

08-505

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනත ප්‍රකාරව පහත සඳහන් සමාගම 2007 ජූලි මස 13 වෙනි දින සංස්ථාපනය කරන ලදී.

සමාගමේ නම : සේනාදි සාවින්දි ට්‍රාන්ස්පෝට් ඒජන්ට් ඇන්ඩ් කන්ස්ට්‍රක්ෂන්ස් (පුද්ගලික) සමාගම.
සමාගම් අංකය : පී. වී. 60637
ලියාපදිංචි ලිපිනය : අංක 58, දෙවිසිරිපුර, තලවාකැලේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කෝපරේට් ඩී සොලිට්යෝ (පුද්ගලික) සමාගම,
ලේකම්වරු.

08-477

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය අනුව පහත සඳහන් පෞද්ගලික සමාගම 2007 ජූනි මස 29 වෙනි දින සංස්ථාගත කර ඇත.

සමාගමේ නම : ආර්. ආර්. ඇසෝෂියේට් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පි. වී. 60466
සමාගමේ ලියාපදිංචි කාර්යාලය : අංක 14, ඉන්ඩස්ට්‍රියල් එස්ටේට්, පල්ලෙකැලේ.

ලේකම්.

08-478

---

## ඇටර්නි බලය අවලංගු කිරීම

බර්නාඩ් මෙන්ඩිස් ප්‍රසිද්ධ නොතාරිස් විසින් 2001.11.12 සහ 2002.06.25 දින සහතික කරන ලද අංක 13 සහ 205 දරන ඇටර්නි බලපත්‍ර මත දලවැල්ල හේවගේ සුනිල් වන මා විසින් දලවැල්ල හේවගේ ධර්මසිරි යන අයට දී තිබූ ඇටර්නි බලපත්‍ර අද දින සිට අවලංගු වන අතර එකී බලපත්‍ර මගින් ලබාදී තිබූ බලතල සම්පූර්ණයෙන් අහෝසි වන බව මෙයින් ප්‍රකාශ කර දැනුම් දෙමි.

ඩී. එච්. ධර්මසිරි.

08-479

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීමයි

බත්තරමුල්ල, තලංගම දකුණ, පෙරේරා මාවත, අංක 47/53 දරන ස්ථානයේ පදිංචි ඥාණසිරි විනෝද වික්‍රමරත්න වන මා විසින් එම්. එම්. ෆුවාඩ් ප්‍රසිද්ධ නොතාරිස් විසින් 17.02.2004 වන දින සහතික කරන ලද අංක 3111 දරන ඇටෝර්නි බලපත්‍රය මගින් බත්තරමුල්ල, තලංගම දකුණ, පෙරේරා මාවත, අංක 47/53 දරන ස්ථානයේ පදිංචි චන්ද්‍රා පද්මිනී දසනායක යන අයට පවරා දුන් මාගේ ඇටෝර්නි බලය අද දින සිට අවලංගු කොට ප්‍රත්‍යාදිෂ්ට කරන බව මෙයින් දැනුම් දෙමි.

ජී. වී. වික්‍රමරත්න.

2007.07.24

08-481

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තියෙහි විධිවිධාන යටතේ, පහත විස්තර දැක්වෙන ආයතන සීමා සහිත සමාගමක් ලෙස සංස්ථාපනය කරන ලදී.

1. සමාගමේ නම : සීමාසහිත (ජනතා) ජනතාපුර දකුණ ගැමිදිරිය සමාගම
2. සමාගමේ අංකය : පී. බී. 3256
3. සංස්ථාගත කළ දිනය : 2007.07.23
4. ලි. ප. කාර්යාලයේ ලිපිනය : ජනතාපුර දකුණ, ලුණුගල

සමාගමේ ලේකම්.

08-499

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තියෙහි විධිවිධාන යටතේ, පහත විස්තර දැක්වෙන ආයතන සීමා සහිත සමාගමක් ලෙස සංස්ථාපනය කරන ලදී.

1. සමාගමේ නම : සීමාසහිත (ජනතා) ස්වින්ටන් ගැමිදිරිය සමාගම
2. සමාගමේ අංකය : පී. බී. 3244
3. සංස්ථාගත කළ දිනය : 2007.07.23
4. ලි. ප. කාර්යාලයේ ලිපිනය : සෝලන්ඩ්ස් වත්ත, ස්වින්ටන් කොටස, ලුණුගල.

සමාගමේ ලේකම්.

08-498

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තියෙහි විධිවිධාන යටතේ, පහත විස්තර දැක්වෙන ආයතන සීමාසහිත සමාගමක් ලෙස සංස්ථාපනය කරන ලදී.

1. සමාගමේ නම : සීමාසහිත (ජනතා) කෙහෙල්වත්ත ගැමිදිරිය සමාගම.
2. සමාගමේ අංකය : පී. බී. 3243
3. සංස්ථාගත කළ දිනය : 2007.07.23
4. ලි. ප. කාර්යාලයේ ලිපිනය : සෝලන්ඩ්ස් වත්ත, කෙහෙල්වත්ත, ඔප්ටන්.

සමාගමේ ලේකම්.

08-497

### දැන්වීමයි

01. සමාගමේ නම : සීමාසහිත (ජනතා) කුරුකුදේගම ගැමිදිරිය සමාගම
02. සමාගමේ අංකය : පී. බී. 3208
03. සංස්ථා ගත කළ දිනය : 2007.07.16
04. ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : ශ්‍රී සුදර්මාරාමය, කුරුකුදේගම, පට්ටියගෙදර.

08-488

---

### දැන්වීමයි

01. සමාගමේ නම : සීමාසහිත (ජනතා) පල්ලේවෙල සපුකණුව ගැමිදිරිය, සමාගම
02. සමාගමේ අංකය : පී. බී. 3207
03. සංස්ථා ගතකළ දිනය : 2007.07.16
04. ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : කුරුකුදේ, පට්ටියගෙදර

08-487

---

### දැන්වීමයි

01. සමාගමේ නම : සීමාසහිත (ජනතා) ඇල්ලේවෙල ගැමිදිරිය සමාගම
02. සමාගමේ අංකය: පී. බී. 3215
03. සංස්ථා ගතකළ දිනය : 2007.07.16
04. ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : ඇල්ලේවෙල කොටස, ඌව හයිලන්ඩ්, බණ්ඩාරවෙල.

08-482

---

### දැන්වීමයි

01. සමාගමේ නම : සීමාසහිත (ජනතා) වරකාදණ්ඩ ගැමිදිරිය සමාගම
02. සමාගමේ අංකය: පී. බී. 3216
03. සංස්ථා ගතකළ දිනය : 2007.07.16
04. ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : වරකාදණ්ඩ, පට්ටියගෙදර

08-485

---

### දැන්වීමයි

01. සමාගමේ නම : සීමාසහිත (ජනතා) වැපස්සාවෙල නැගෙනහිර ගැමිදිරිය සමාගම
02. සමාගමේ අංකය: පී. බී. 3257
03. සංස්ථා ගත කළ දිනය : 2007.07.26
04. ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : වැපස්සාවෙල, පට්ටියගෙදර

08-484

---

### දැන්වීමයි

01. සමාගමේ නම : සීමාසහිත (ජනතා) වැපස්සාවෙල බටහිර ගැමිදිරිය සමාගම
02. සමාගමේ අංකය : පී. බී. 3210
03. සංස්ථා ගත කළ දිනය : 2007.07.18
04. ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය: වැපස්සාවෙල, පට්ටියගෙදර

08-483

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනත ප්‍රකාරව පහත සඳහන් සමාගම 2007 ජූලි මස 19 වැනි දින සංස්ථාපනය කරන ලදී.

සමාගමේ නම : ඇඩ්ලින්ක් ටෙක්නොලජීස් (පුද්ගලික) සමාගම
සමාගම් අංකය: පී. වී. 60722
ලියාපදිංචි ලිපිනය : අංක 321, ධැම් ස්ට්‍රීට්, කොළඹ 12

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කෝපරේට් ඩී පොලිටියෝ (පුද්ගලික) සමාගම,
ලේකම්වරු.

08-476

---

### දැන්වීමයි

01. සමාගමේ නම : සීමාසහිත (ජනතා) හින්නාරංගොල්ල ගැමිදිරිය සමාගම
02. සමාගමේ අංකය : පී. බී. 3209
03. සංස්ථා ගත කළ දිනය : 2007.07.16
04. ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : හින්නාරංගොල්ල, ඇටම්පිටිය

08-486

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තියෙහි විධිවිධාන යටතේ, පහත විස්තර දැක්වෙන ආයතන සීමාසහිත සමාගමක් ලෙස සංස්ථාපනය කරන ලදී.

1. සමාගමේ නම : සීමාසහිත (ජනතා) ඕල්ඩ් පැක්ට්‍රි ගැමිදිරිය සමාගම
2. සමාගමේ අංකය : පී. බී. 3242
3. සංස්ථාගත කළ දිනය : 2007.07.23
4. ලි. ප. කාර්යාලයේ ලිපිනය : ඕල්ඩ් පැක්ට්‍රි වත්ත, ඔප්ටන්.

සමාගමේ ලේකම්.

08-500

## නිවේදනයයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර පහත දක්වා ඇති සමාගම සංස්ථාගත කිරීම පිළිබඳව අපි මෙසේ දැනුම් දී සිටිමු.

සමාගමේ නම : සෙරන්ඩිබ් ඉන්ටර්නැෂනල් වෙන්චර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්, අංක 40, ධර්මපාල මාවත, මාදිවෙල, කෝට්ටේ.
සමාගමේ අංකය : පී. වී. 60224
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 40, ධර්මපාල මාවත, මාදිවෙල, කෝට්ටේ.

සංස්ථාගත කරන ලද දිනය : 2007 ජූනි 11 වැනි දින

සමාගම් ලේකම්වරු,
කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

08 – 551

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9(1) වැනි වගන්තියෙහි විධිවිධාන යටතේ, පහත විස්තර දැක්වෙන ආයතනය සීමාසහිත සමාගමක් ලෙස සංස්ථාපනය කරන ලදී.

1. සමාගමේ නම : සීමාසහිත (ජනතා) මිල්ලබැද්ද ගැමිදිරිය සමාගම
2. සමාගමේ අංකය : පී. බී. 3126
3. සංස්ථාපනය කළ දිනය : 2007.07.10
4. ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : මිල්ලබැද්ද, හොප්ටන්

සමාගමේ ලේකම්.

08-531

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9(1) වැනි වගන්තියෙහි විධිවිධාන යටතේ, පහත විස්තර දැක්වෙන ආයතනය සීමාසහිත සමාගමක් ලෙස සංස්ථාපනය කරන ලදී.

1. සමාගමේ නම : සීමාසහිත (ජනතා) වේරගොඩ ගැමිදිරිය සමාගම
2. සමාගමේ අංකය : පී. බී. 3199
3. සංස්ථාපනය කළ දිනය : 2007.07.13
4. ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : වේරගොඩ, ලුණුගල

සමාගමේ ලේකම්.

08-532

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9(1) වැනි වගන්තියෙහි විධිවිධාන යටතේ, පහත විස්තර දැක්වෙන ආයතනය සීමාසහිත සමාගමක් ලෙස සංස්ථාපනය කරන ලදී.

1. සමාගමේ නම : සීමාසහිත (ජනතා) පීස්සගම ගැමිදිරිය සමාගම
2. සමාගමේ අංකය : පී. බී. 3192
3. සංස්ථාපනය කළ දිනය : 2007.07.13
4. ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : පීස්සගම, හොප්ටන්

සමාගමේ ලේකම්.

08-533

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9(1) වැනි වගන්තියෙහි විධිවිධාන යටතේ, පහත විස්තර දැක්වෙන ආයතනය සීමාසහිත සමාගමක් ලෙස සංස්ථාපනය කරන ලදී.

1. සමාගමේ නම : සීමාසහිත (ජනතා) කොට්ටල්බැද්ද, ගැමිදිරිය සමාගම
2. සමාගමේ අංකය : පී. බී. 3104
3. සංස්ථාපනය කළ දිනය : 2007.07.10
4. ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : කොට්ටල්බැද්ද, ලුණුගල

සමාගමේ ලේකම්.

08-534

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9(1) වැනි වගන්තියෙහි විධිවිධාන යටතේ, පහත විස්තර දැක්වෙන ආයතනය සීමාසහිත සමාගමක් ලෙස සංස්ථාපනය කරන ලදී.

1. සමාගමේ නම : සීමාසහිත (ජනතා) උඩකිරුව, ගැමිදිරිය සමාගම
2. සමාගමේ අංකය : පී. බී. 3196
3. සංස්ථාපනය කළ දිනය : 2007.07.13
4. ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : උඩකිරුව, ලුණුගල

සමාගමේ ලේකම්.

08-535

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9(1) වැනි වගන්තියෙහි විධිවිධාන යටතේ, පහත විස්තර දැක්වෙන ආයතනය සීමාසහිත සමාගමක් ලෙස සංස්ථාපනය කරන ලදී.

1. සමාගමේ නම : සීමාසහිත (ජනතා) පල්ලේකිරුව ගැමිදිරිය සමාගම
2. සමාගමේ අංකය : පී. බී. 3179
3. සංස්ථාපනය කළ දිනය : 2007.07.10
4. ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : පල්ලේකිරුව, ලුණුගල

සමාගමේ ලේකම්.

08-536

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වැනි වගන්තියෙහි විධිවිධාන යටතේ, පහත විස්තර දැක්වෙන ආයතනය සීමාසහිත සමාගමක් ලෙස සංස්ථාපනය කරන ලදී.

1. සමාගමේ නම : සීමාසහිත (ජනතා) මඩුවත්ත ගැමිදිරිය සමාගම
2. සමාගමේ අංකය : පී. බී. 3124
3. සංස්ථාපනය කළ දිනය : 2007.07.10
4. ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : මඩුවත්ත, හොප්ටන්

සමාගමේ ලේකම්.

08-537

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තියෙහි විධිවිධාන යටතේ, පහත විස්තර දැක්වෙන ආයතනය සීමාසහිත සමාගමක් ලෙස සංස්ථාපනය කරන ලදී.

1. සමාගමේ නම : සීමාසහිත (ජනතා) පාර්ක් ගැමිදිරිය සමාගම
2. සමාගමේ අංකය : පී. බී. 3202
3. සංස්ථාගත කළ දිනය : 2007.07.13
4. ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : පර්ක් වත්ත, ලුණුගල,

සමාගමේ ලේකම්.

08 – 462

## සමාගමේ නම වෙනස් කිරීම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 8 වැනි වගන්තියේ (2) යටතේ 2007 ජූලි 13 වැනි දා සිට ක්‍රියාත්මක වේ.

කලින් තිබූ සමාගමේ නම : යූඉ ( **Youyi** ) ෂිපින් ඒජන්සීස් ප්‍රයිවට් ලිමිටඩ්
සමාගමේ අංකය : **N (pvs)** 15827
සමාගමේ ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 45, බ්‍රේබෲක් වීදිය, කොළඹ 02.
සමාගමේ නම නාමය : කොස්මෝ ලොජිස්ටික්ස් ප්‍රයිවට් ලිමිටඩ්

බිස්නස්මේට් ප්‍රයිවට් ලිමිටඩ්,
ලේකම්වරු,

අංක 45, බ්‍රේබෲක් වීදිය,
කොළඹ 02
2007 ජූලි මස 16 වැනි දින.

08 – 523

## 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ නිවේදනය

01. සමාගමේ නම : සීමාසහිත මිල්ක් හවුස් (පුද්ගලික)
02. ලියාපදිංචි කල දිනය : 2007.06.20
03. සමාගමේ අංකය : පී. වී. 60330
04. ලියාපදිංචි කාර්යාලය : අංක 11/61, පාසල් මාවත, ඇතුල් කෝට්ටේ, කෝට්ටේ.

බිස්නස් පැල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගමේ ලේකම්වරු

අංක 324,
කොළඹ පාර,
පිළියන්දල.

08 – 512

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත විස්තර දැක්වෙන ආයතනය සීමාසහිත සමාගමක් ලෙස සංස්ථාපනය කරන ලදී.

1. සමාගමේ නම : සීමාසහිත (ජනතා) බුළුගොල්ල ගැමිදිරිය සමාගම
2. සමාගමේ අංකය : පී. වී. 3201
3. සංස්ථාගත කළ දිනය : 2007.07.13
4. ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : බුළුගොල්ල, ඔප්ටන්.

සමාගමේ ලේකම්.

08 – 461

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් ආඥාපනත ප්‍රකාරව සංස්ථාපනය කරන ලද පහත සමාගම පිළිබඳ තොරතුරු එම පනතේ වගන්ති අංක 9 උප වගන්ති 1 නියමයන්ට අනුකූලව මහජනතාව වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

1. සමාගමේ නම : ඇමෙල් ඉංජිනියරිං (ප්‍රයිවට්) ලිමිටඩ්
2. ලියාපදිංචි අංකය : P. V. 60613
3. ලියාපදිංචි දිනය : 2007 ජූලි මස 11
4. ලියාපදිංචි ලිපිනය : අංක 9/1, දෙවන පටුමග, රත්මලාන

සමාගම් ලේකම්.

08-626

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 9(1) වැනි වගන්තියෙහි විධිවි ධාන යටතේ, පහත විස්තර දැක්වෙන ආයතනය සීමාසහිත සමාගමක් ලෙස සංස්ථාගත කරන ලදී.

1. සමාගමේ නම : සීමාසහිත (ජනතා) බටකඩ ගැමිදිරිය සමාගම
2. සමාගමේ ලියාපදිංචි අංකය : පී. බී. 3212
3. සංස්ථාගත කළ දිනය : 2007 ජූලි 16
4. ලියාපදිංචි ලිපිනය : බටකඩ, උඩනිරිඇල්ල

යූ. ඩබ්. අමරදාස,
සභාපති, අධ්‍යක්ෂ.

08-586

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 9(1) වැනි වගන්තියෙහි විධිවි ධාන යටතේ, පහත විස්තර දැක්වෙන ආයතනය සීමාසහිත සමාගමක් ලෙස සංස්ථාගත කරන ලදී.

1. සමාගමේ නම : සීමාසහිත (ජනතා) හල්දොල ගැමිදිරිය සමාගම
2. සමාගමේ ලියාපදිංචි අංකය : පී. බී. 3250
3. සංස්ථාගත කළ දිනය : 2007 ජූලි 24
4. ලියාපදිංචි ලිපිනය : හල්දොල, කරංගොඩ

එච්. වයි. කරුණාදාස,
සභාපති අධ්‍යක්ෂ.

08-587

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 9(1) වැනි වගන්තියෙහි විධිවි ධාන යටතේ, පහත විස්තර දැක්වෙන ආයතනය සීමාසහිත සමාගමක් ලෙස සංස්ථාගත කරන ලදී.

1. සමාගමේ නම : සීමාසහිත (ජනතා) පන්නිල ගැමිදිරිය සමාගම
2. සමාගමේ ලියාපදිංචි අංකය : පී. බී. 3251
3. සංස්ථාගත කළ දිනය : 2007 ජූලි 24
4. ලියාපදිංචි ලිපිනය : පන්නිල, උඩනිරිඇල්ල, රත්නපුර

ඉරෝෂන් වීරසේකර,
සභාපති අධ්‍යක්ෂ.

08-588

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 9(1) වැනි වගන්තියෙහි විධිවි ධාන යටතේ, පහත විස්තර දැක්වෙන ආයතනය සීමාසහිත සමාගමක් ලෙස සංස්ථාගත කරන ලදී.

1. සමාගමේ නම : සීමාසහිත (ජනතා) නිරිඇල්ල බටහිර ගැමිදිරිය සමාගම
2. සමාගමේ ලියාපදිංචි අංකය : පී. බී. 3249
3. සංස්ථාගත කළ දිනය : 2007 ජූලි 24
4. ලියාපදිංචි ලිපිනය : නිරිඇල්ල, උඩනිරිඇල්ල, රත්නපුර

හේමපාල ඇතුලත්මුදලි,
සභාපති අධ්‍යක්ෂ.

08-589

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 9 (1) වගන්තියෙහි විධිවිධාන යටතේ පහත විස්තර දැක්වෙන ආයතනය සීමාසහිත සමාගමක් ලෙස සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : සීමාසහිත (ජනතා) වැලිවැන්න, වැලිආර ගැමිදිරිය සමාගම
සමාගමේ අංකය : පී. බී. 3014
සංස්ථාගත කළ දිනය : 2007 ජූනි මස 25
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : ගොඩවාන කොරටුව, වැලිවැන්න, නෙටොල්පිටිය

සමාගමේ ලේකම්.

08-597

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තියෙහි විධිවිධාන යටතේ පහත විස්තර දැක්වෙන ආයතනය සීමාසහිත සමාගමක් ලෙස සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : සීමාසහිත (ජනතා) නිදහස්ගම නැගෙනහිර ගැමිදිරිය සමාගම
සමාගමේ අංකය : පී. බී. 3035
සංස්ථාගත කළ දිනය : 2007 ජුනි මස 28
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 161, රන්න නැගෙනහිර, රන්න

සමාගමේ ලේකම්.

08-598

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තියෙහි විධිවිධාන යටතේ පහත විස්තර දැක්වෙන ආයතනය සීමාසහිත සමාගමක් ලෙස සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : සීමාසහිත (ජනතා) පලතුඩුව ගැමිදිරිය සමාගම
සමාගමේ අංකය : පී. බී. 3040
සංස්ථාගත කළ දිනය : 2007 ජුනි මස 28
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : ශ්‍රී ජයසුමනාරාම විහාරස්ථානය, පලතුඩුව, තංගල්ල

සමාගමේ ලේකම්.

08-599

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තියෙහි විධිවිධාන යටතේ පහත විස්තර දැක්වෙන ආයතනය සීමාසහිත සමාගමක් ලෙස සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : සීමාසහිත (ජනතා) වගේගොඩ, රන්කොත්මළුව ගැමිදිරිය සමාගම
සමාගමේ අංකය : පී. බී. 3039
සංස්ථාගත කළ දිනය : 2007 ජුනි මස 28
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 18, පාසැල් මාවත, වගේගොඩ, තංගල්ල

සමාගමේ ලේකම්.

08-600

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තියෙහි විධිවිධාන යටතේ පහත විස්තර දැක්වෙන ආයතනය සීමාසහිත සමාගමක් ලෙස සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : සීමාසහිත (ජනතා) අලුත්ගොඩ ගැමිදිරිය සමාගම
සමාගමේ අංකය : පී. බී. 3041
සංස්ථාගත කළ දිනය : 2007 ජුනි මස 28
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : සියඹලාගහ වත්ත, අලුත්ගොඩ, තංගල්ල

සමාගමේ ලේකම්.

08-601

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තියෙහි විධිවිධාන යටතේ පහත විස්තර දැක්වෙන ආයතනය සීමාසහිත සමාගමක් ලෙස සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : සීමාසහිත (ජනතා) වල්ගම්එළිය, ගැමිදිරිය සමාගම
සමාගමේ අංකය : පී. බී. 3038
සංස්ථාගත කළ දිනය : 2007 ජුනි මස 28
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 77, ගොඩවානාගොඩ, තංගල්ල

සමාගමේ ලේකම්.

08-602

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් ආඥා පනත ප්‍රකාරව සංස්ථාපනය කරන ලද පහත සමාගම පිළිබඳ තොරතුරු එම පනතේ වගන්ති අංක 9 උපවගන්ති 1 නියමයන්ට අනුකූලව මහජනතාව වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : ඕටා (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : P. V. 60615
ලියාපදිංචි දිනය : 2007 ජුලි මස 24
ලියාපදිංචි ලිපිනය : අංක 9/1, දෙවන පටුමග, රත්මලාන

සමාගමේ ලේකම්.

08-625

# රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම්පත්

## 2008 වර්ෂය සඳහා රා සහ විදේශීය මත්පැන් තැබෑරුම් විකිණීම

කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළකර ඇති 1983 වර්ෂයට හා ඊට පසු කාල පරිච්ඡේදයන් සඳහා වලංගු රා තැබෑරුම් හා විදේශීය මත්පැන් (ධාන්‍යවලින් මෙරට නිපදවන බීම වර්ග ඇතුළුව) තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසිවලටත්, එම කාලය තුළ දී පවත්නා සෑම සුරාබදු කොන්දේසිවලටත් යටත්ව, 2008 වර්ෂය තුළ දී පහත සඳහන් උපලේඛනයන්හි දැක්වෙන රා තැබෑරුම්වල සහ විදේශීය මත්පැන් (ධාන්‍යවලින් මෙරට නිපදවන ලද බීම වර්ග ඇතුළුව) සිල්ලරට විකිණීමෙන් තනි අයිතිය මිලදී ගැනීම සඳහා කොත්මලේ ප්‍රාදේශීය ලේකම් විසින් 2007.09.04 දින පහත සඳහන් උපලේඛනයෙහි දැක්වෙන වේලාව දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

02 (අ) සෑම ටෙන්ඩරයක්ම දිවයිනේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් පෝරමයේ විය යුතුය.

(ආ) ටෙන්ඩර් මුදලක් වශයෙන් ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක පහත උපලේඛනයේ දැක්වෙන ආකාර ටෙන්ඩර් මුදලක් තැන්පත් කර ලබා ගන්නා නිල කුවිතාන්සියක්, සහ

(ඇ) ටෙන්ඩර්කරුගේ ඉඩකඩම් ආදී නිශ්චල දේපළ පිහිටි කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබා ගන්නා ලද ටෙන්ඩර්කරුගේ වත්කම් පිළිබඳ සහතිකයක් ටෙන්ඩරය සමග ඉදිරිපත් කළ යුතුය.

ටෙන්ඩර් සහ වත්කම් පිළිබඳ සහතික ඉදිරිපත් කිරීම පිළිබඳව යථොක්ත රා තැබෑරුම් විකිණීමේ කොන්දේසි වල සහ විදේශීය මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසිවල අඩංගු නියමයන් විධිමත් ලෙස පිළිපැදිය යුතු බව ටෙන්ඩර්කරුවන් වෙත නිවේදනය කෙරේ.

(ඈ) ටෙන්ඩර්පත්‍ර සම්පූර්ණ කිරීමේ දී පහත සඳහන් අවශ්‍යතාවයන් කෙරෙහි ද සැළකිලිමත් විය යුතුය,

(i) ටෙන්ඩර්පත්‍රය මුළුමනින්ම සම්පූර්ණ කළ යුතුය. මෙසේ කිරීමේ දී එහි සඳහන් කෙරෙන ගණන් ඉලක්කමෙන් පමණක් නොව අකුරින් ද ලිවිය යුතුය.

(ii) සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් පත්‍රවල නියමිත සාක්ෂිකරුවන්ගේ අත්සන් වලට අමතරව පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ හැඳුනුම්පත්‍ර අංකය ද යෙදිය යුතුය.

(iii) සෑම වෙනස් කිරීමක්/කපා හැරීමක් ටෙන්ඩර්කරුගේ සම්පූර්ණ අත්සන හා දිනය යෙදීමෙන් සහතික කළ යුතුය.

(iv) සෑම සාර්ථක ටෙන්ඩර්කරුවෙකු ම ටෙන්ඩර් පෝරමය සමග තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතුය. මෙම නියමයන්ට පටහැනි ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරන ලද ටෙන්ඩර්පත්‍රය ටෙන්ඩර් තැන්පත් මුදල සඳහා ලබා ගන්නා ලද නිල කුවිතාන්සියක්, වත්කම් පිළිබඳ සහතිකයත් සමග ලියුම් කවරයක බහා සීල් තබා කවරයේ වම් කෙළවරේ මුදුනේ නියමිත තැබෑරුම් අංකය සහ නම සඳහන් කර කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඒ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ ටෙන්ඩර් භාර ගැනීම අවසන් වීමට පෙර තැන්පත් කළ යුතුයි. ටෙන්ඩර් පත්‍රය තැපෑලෙන් එවන්නේ නම් ටෙන්ඩර් භාර ගැනීමේ වේලාව ඉකුත් වීමට පෙර "ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, කොත්මලේ" වෙත ලැබෙන සේ ලියාපදිංචි කළ සීඝ්‍රගාමී තැපෑලෙන් එවිය යුතුය.

04. ටෙන්ඩර් භාර ගැනීමේ අවසන් වේලාව පහත සඳහන් උපලේඛනයේ දැක්වේ. එකී වේලාවට ටෙන්ඩර්කරුවන් කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතුය.

05. ඕනෑම ටෙන්ඩරයක් භාර ගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ බලය මා සතුය.

06. තෝරාගත් ටෙන්ඩර්කරු, ගැනුම්කරු ලෙස ප්‍රකාශයට පත් කළ වහාම එදින ප.ව. 2.00 ට පෙර ඇප තැන්පත් මුදල වශයෙන් කොත්මලේ ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලැබිය හැකි වාරික තුනකට නොඅඩු මුදලක් ඇප තැන්පත් වශයෙන් කොත්මලේ ප්‍රාදේශීය ලේකම් වෙත තැන්පත් කළ යුතුය. මුළු මුදල මා නමින් පුඩළුඹය මහජන බැංකුවේ වර්ෂයක ස්ථිර තැන්පත් ගිණුමක රඳවා තැබීමට රේන්දකරුවන් එකඟ විය යුතුය. මෙම තැන්පතුව මුදලින් හෝ බැංකුවක් විසින් ගෙවීම සඳහා ද යන්න සටහන් කරන ලද චෙක්පතකින් හෝ ලංකා බැංකුවෙන් හෝ මහජන බැංකුවෙන් "ආරක්ෂිත චෙක්පත්" ස්වරූපයෙන් ගෙවිය යුතුය. අවශ්‍ය මුද්දර ආදිය ඉදිරිපත් කොට කොන්දේසි මාලාවට සහ කොන්ත්‍රාත්තුවට ටෙන්ඩර්කරු අත්සන් තැබිය යුතුය.

07. පොරොන්දු වන ටෙන්ඩර් මුදල වාරික වශයෙන් මුදලින් පමණක් ගෙවිය හැකි අය ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි.

08. කිසියම් ටෙන්ඩරයක් කිහිප දෙනෙකු විසින් හවුලේ ඉදිරිපත් කරනු ලබන්නේ නම් ඒ එක් එක් අයවලුන්ගේ පෞද්ගලික ලිපිනයන් වෙන වෙනම පැහැදිලිව දැක්විය යුතුය.

09. යම් තැබැරුමක් මෙදින විකුණනු නොලැබුවහොත් ඒවා 2007 ඔක්තෝබර් මස 03 වන දින පෙ.ව. 10.30 ට මෙම ස්ථානයේ දී ම නැවත විකුණනු ලැබේ.

10. මෙම ටෙන්ඩර් විකිණීම සම්බන්ධයෙන් මාගේ තීරණය අවසාන තීරණය වේ.

11. රේන්ද විකිණීම හා අදාළ කොන්දේසි සහ වෙනත් වැඩි විස්තර කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් විමසා ලබාගත හැකිය.

ජානක ධර්මකීර්ති,
ප්‍රාදේශීය ලේකම්,
කොත්මලේ.

2007 ජූලි මස 23 වැනි දින,
කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

### උපලේඛනය

| *අංකය හා තැබැරුමේ නම* | *තැබැරුම පිහිටිය යුතු ස්ථානය* | *ටෙන්ඩර් භාර ගැනීම අවසන් වන වේලාව* | *ටෙන්ඩර් ඇප තැන්පත් මුදල රු.* |
|---|---|---|---|
| *රා තැබැරුම* | | | |
| 1. කඩදොරපිටිය | කඩදොරපිටිය ග්‍රාමය තුළ | 2007.09.04 පෙ.ව.10.30 | 1,000 |
| 2. ඕතලාව | තෝරාගනු ලබන ස්ථානයට කොත්මලේ ප්‍රාදේශීය ලේකම්ගෙන් අනුමැතිය ලබාගත් ලිපියක් ඉදිරිපත් කළ යුතුය | 2007.09.04 පෙ. ව. 10.30 | 1,000 |
| 3. කටුකිතුල | කටුකිතුල ග්‍රාමය තුළ | 2007.09.04 පෙ.ව.10.30 | 1,000 |
| විදේශ මත්පැන් තැබැරුම : අංක 02 පූඩළුඔය | | | |
| | පූඩළුඔය නගරය ඉහළ කඩවීදිය | 2007.09.04 පෙ.ව.10.30 | 3,000 |

08-552

---

## හලාවත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

### 2008 වර්ෂයේ විදේශ මත්පැන් තැබැරුම් රේන්ද විකිණීම

2008 ජනවාරි මස 01 වන දින සිට 2008 දෙසැම්බර් මස 31 දින දක්වා කාලය තුළ විදේශ මත්පැන් (ධාන්‍ය මත්පැන් ඇතුළුව) විකිණීම් කොන්දේසි හා සෑම සුරාබදු බලපත්‍රයකටම අදාලව එවකට පවත්නා කොන්දේසි මාලාවට යටත්ව පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් විදේශ මත්පැන් තැබැරුම් සඳහා ටෙන්ඩර් බාරගනු ලැබේ.

02. සෑම ටෙන්ඩරයක්ම ඕනෑම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක සකස් විය යුතු අතර, පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති ටෙන්ඩර් මුදල් තැන්පත් කළ බවට ලබාගත් කුවිතාන්සියක් හා අදාල ටෙන්ඩරයේ සඳහන් මුදලෙන් යටත් පිරිසෙයින් 15% ක වටිනාකමට ලබාගත් වත්කම් සහතිකයක් ද ඊට ඇමිණිය යුතුය.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරනු ලැබූ, සෑම ටෙන්ඩරයක්ම මුද්‍රා තබන ලද කවරයක බහා එහි මුදුනේ වම් කෙළවරෙහි අංක.............. දරන විදේශ මත්පැන් තැබැරුම සඳහා ටෙන්ඩර් පත්‍රය යනුවෙන් පහත සඳහන් උපලේඛනයේ සඳහන් පරිදි තැබැරුමේ නම සහ අංකය සඳහන් කර 2007.09.05 දින පෙ.ව. 10.30 ට පෙර හලාවත ප්‍රාදේශීය ලේකම් වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි. *නැතහොත්* එම වේලාවට පෙර හලාවත ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය.

04. 2008 වර්ෂය සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කිරීම 1982.08.20 දින පලවී ඇති අංක 207 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* දැක්වෙන විදේශ මත්පැන් තැබැරුම් කොන්දේසිවලට අනුකූල විය යුතුය.

05. 2007.09.05 දින පෙ.ව. 10.30 ට ටෙන්ඩර් පත්‍ර බාරගැනීම අවසන් කළ වහාම ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේ සියළුම ටෙන්ඩර්කරුවන් හලාවත ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතුය.

06. පූර්වෝක්ත දින විකිණීමට නොහැකි වූ විදේශ මත්පැන් තැබැරුම් නැවත විකිණීම 2007.10.05 දින පෙ.ව.10.30 ට සිදුකරනු ලැබේ. එදින ටෙන්ඩර් ඉදිරිපත් කිරීම මෙම ගැසට් නිවේදනයේ අවශ්‍යතාවන්ට අනුකූලව විය යුතුය.

07. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර හලාවත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකිය (දුරකථන අංකය : 032-2223205.

*උපලේඛනය*

| *කොට්ඨාසය* | *ග්‍රාමය* | *ටෙන්ඩර් භාරගන්නා දිනය හා වේලාව* | *ටෙන්ඩර් භාරගන්නා දෙවන දිනය හා වේලාව* | *තැබැරුම් විවෘත කරන වේලාව* | *තැබැරුම් වහන වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල රු.* |
|---|---|---|---|---|---|---|
| හලාවත | අංක 07 කොටස පිටිපන වීදිය හලාවත | 2007.09.05 පෙ.ව.10.30 | 2007.10.05 පෙ.ව.10.30 | පෙ.ව.11.00 ප.ව.5.00 | ප.ව. 2.00 ප.ව .8.00 | 500 |
| හලාවත | අංක 06 කොටස කඩවීදිය, හලාවත | එම | එම | එම | එම | 1500 |

ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය,
හලාවත.

එස්. ශානිකා රෝෂනී,
සහකාර ප්‍රාදේශීය ලේකම්,
හලාවත ප්‍රාදේශීය ලේකම් වෙනුවට.

08-604

---

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

## සීමාසහිත හැටන් නැෂනල් බැංකුව - බදුල්ල ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බදුල්ල ප්‍රසිද්ධ නොතාරිස් ජී. එස්. කෝදාගොඩ විසින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ නමට ලියා සහතික කරන ලද්දා වූ ද 1998.01.07 වන දින සහ අංක 755 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම රත්නායක මුදියන්සේලාගේ ජයන්ත යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින්, සීමාසහිත හැටන් නැෂනල් බැංකුවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල් සියළු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියළුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපළ 2007 සැප්තැම්බර් මස 07 වන දින ප.ව.11.00 ට ඇරඹෙන පරිදි දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, බදුල්ල, කඩවත් සතරේ සහ බදුල්ල නගරයේ අළුත්වෙලගම පිහිටි දළුක්ගහකුඹුර නමින් හඳුන්වනු ලබන ඉඩමේ කොටසකට බලයලත් මානක එම්. කේ. සී. ප්‍රේමචන්ද්‍ර විසින් මැන සාදන ලද 1993.01.13 දිනැති අංක 2601 දරන පිඹුරේ නිරූපිත ලොට් අංක 1 දරන ඉඩම. විශාලත්වය පර්චස් 10.764 යි.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2007.06.15 දින දරන රජයේ *ගැසට් පත්‍රය* හා 2007.07.12 වන දින අයිලන්ඩ්, දිවයින සහ තිනකරන් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය* .– වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය.

1. ගැණුම් මුදලින් සියයට දහයත් (10%) ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකක් (1%),
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහක් (2.5%)ද,
4. ලිපිකරු හා සෝෂක ගාස්තු රුපියල් පන්සියයක් (රු.500) ද,
5. සියළුම ප්‍රචාරක වියදම් ද,
6. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදාහක් (රු.2,000) ද වේ.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල විකිණීමේ දින සිට දින 30 ක් ඇතුලත සීමාසහිත හැටන් නැෂනල් බැංකුව වෙත ගෙවිය යුතුය. දින 30 ක් ඇතුලත ඉතිරි මුදල් නොගෙවුවහොත් ගෙවා ඇති 10%ක මුදල අහිමි කිරීමට සහ දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාල ඔප්පු හා අදාල ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු ප්‍රධාන කළමණාකරු (ණය අයකිරීම්), සීමාසහිත හැටන් නැෂනල් බැංකුව, අංක

479, ටී. බී. ජයා මාවත, කොළඹ 10, දුරකථන අංක 2661815, 2661808 ගෙන් ලබා ගත හැක.

රංජිත එස්. මහානාම,
සාම විනිසුරු (මුළු දිවයිනටම),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු
හා බලයලත් වෙන්දේසිකරු.

ආර්. එස්. එම්. ඔක්ෂන්ස්,
මහානාම ඩ්‍රයිව්,
අංක 474, පිටකෝට්ටේ,
කෝට්ටේ.
දුරකථන අංක : 2863121.

08-596/2

---

## මහජන බැංකුව - හිඟුරක්ගොඩ (006) ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ විහාරගම නමැති ගමෙහි පදිංචියට සුදුසු පරිසරයක පිහිටි, ප්‍රමාණයෙන් අක්කර දෙකයි පර්චස් දහ අටක් (අක්කර 02, රූඩ් 0, පර්චස් 18) ක් වූ ඉඩම මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින්, 2007.09.06 වැනි දින ප. ව. 2.30 ට දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*රජයේ ගැසට් පත්‍රයේ* 2007.02.02 දින ද, "දිනමිණ" පත්‍රයේ 2007.01.22 දින ද,"තිනකරන් " හා "ඩේලි නිව්ස් " පුවත්පත්වල 2007.01.19 දින ද පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම.*–හිඟුරක්ගොඩ සිට මැදිරිගිරිය පාරේ කි. මී. 10 ක් පමණ ගියවිට හමුවන දිවුලන්කඩවල මහ විද්‍යාල පසු කර වම් පසට ඇති විහාරගම පාරේ කි. මී. 1.4 ක් ගිය කල හමුවන දේවාලය අසලින් දකුණට හැරී මද දුරක් ගොස් වම් පසට ඇති ගුරු පාරේ මීටර් 100 ක් පමණ ගියවිට පාරේ දකුණු පසින් මෙම ඉඩම පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.*–වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

1. ගැණුම් මිලෙන් 10%ක්,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1%ක්,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක්,
4. ලිපිකරු හා නිවේදන ගාස්තු වශයෙන් රු. 500 ක්,
5. විකුණුම් වියදම් සහ වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි 90%ක් වූ මුදල විකුණුම් දින සිට දින 30 ක් ඇතුළත පොළොන්නරුව, නව නගරය, මහජන බැංකුව ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය, සහකාර සාමාන්‍යාධිකාරී (උතුරු මැද කලාපය) වෙත ගෙවිය යුතුය.

දුරකථන අංක : 027-2224404/2223900/2225760
ෆැක්ස් අංකය : 027-2223522

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැකිය.

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කරන ලද මුදල් දින 30 ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මිලෙන් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ෂොක්මන් සහ සමරවික්‍රම,
ISO 9001-2000 සහතිකය ලත් ශ්‍රී ලංකාවේ
පිළිගත් පුරෝගාමී වරලත් වෙන්දේසිකරුවෝ,
තක්සේරුකරුවෝ සහ දේපල ඒජන්තවරු.

*ප්‍රධාන කාර්යාලය* :
අංක 24, ටොරිංටන් පාර,
මහනුවර.
දුරකථන අංකය : 081-2227593
ෆැක්ස් අංකය : 081-2224371
ඊමේල් : schokmankandy@sltnet.lk

*නවනගර කාර්යාලය* :
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 05.
දුරකථන අංකය : 011-2502680
ෆැක්ස් අංකය : 011-2585408
ඊමේල් : schokman @samera 1892.com.

08-573

---

## සීමාසහිත හැටන් නැෂනල් බැංකුව - ගාල්ල ශාඛාව

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් ඒ. එම්. එස්. මරික්කාර් විසින් සහතික කරන ලද්දාවූ ද සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ නමට ලියා සහතික කරන ලද්දාවූ 1998.11.09 දින සහ අංක 7688 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම සෙනරත් ආනන්ද විමලසේන යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින්,

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, තල්පේ පත්තුවේ, හබරාදුව ප්‍රාදේශීය සභා සීමාව තුල දළුවැල්ලේ පිහිටි පදිලිගේවත්ත *හෙවත්* මහා විදානෙලාගේ වත්ත නමින් හඳුන්වනු ලබන ඉඩමෙන් බෙදා වෙන් කරන ලද ලොට් 1 සහ ලොට් 2 දරන ඉඩම් කැබලි දෙක සහ ඊට අයත් ගොඩනැගිලි ආදී සියළු දේත් සමග වේ.

විශාලත්වය ලොට් 1:, රූ. 2 පර්චස් 5.6, ලොට් 2 : පර්චස් 10.2

සීමාසහිත හැටන් නැෂනල් බැංකුවෙන් මා වෙත පවරා ඇති බලතල ප්‍රකාර පහත සඳහන් දේපළ පිහිටි ස්ථානයේ දී 2007 සැප්තැම්බර් මස 03 වන දින පෙ. ව. 10.00 ට මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2007.03.09 දින *රජයේ ගැසට් පත්‍රය* සහ 2007.03.20 වන දින අයිලන්ඩ්, දිවයින, සහ තිනකරන් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.*– වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය.

1. ගැණුම් මුදලින් සියයට දහය (10%) ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එක (1%) ක් ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකහමාරක් (2.5%) ද,
4. ලිපිකරු හා සෝෂක ගාස්තු රුපියල් පන්සියය (රු. 500) ක් ද,
5. සියළුම ප්‍රචාරක වියදම්,
6. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදහ (රු. 2,000) ක් ද වේ.

ගැණුම් මිලෙන් ඉතිරි 90%ක් වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත සී/ස හැටන් නැෂනල් බැංකුව වෙත ගෙවිය යුතුය. දින 30ක් ඇතුළත ඉතිරි මුදල් නොගෙවුවහොත් ගෙවා ඇති 10% අහිමි කිරීමට සහ දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා අදාළ ලියවිලි පරීක්ෂා සහ වෙනත් තොරතුරු සීමාසහිත හැටන් නැෂනල් බැංකුව, ගාල්ල ශාඛාව (දුරකථන අංක: 091-2232248) හෝ කොළඹ 10, ටී. බී. ජයා මාවත, අංක 479, ප්‍රධාන කාර්යාලයේ ප්‍රධාන කළමණාකරු (ණය අයකිරීම්) දුරකථන අංක : 2661815, 2661816 ගෙන් ලබාගත හැක.

එන්. එච්. පී. එෆ්. ආරියරත්න,
උසාවි කොමසාරිස් හා බලයලත් වෙන්දේසිකරු.

අංක 34/31 සහ 32,
නීතිඥ කාර්යාලය සංකීර්ණය, කොළඹ 12.

08-548

---

## මහජන බැංකුව - පොළොන්නරුව නගර (232) ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, ගිරිතලේ නමැති ගමේ, ප්‍රධාන මාර්ගයට හා ගිරිතලේ වැවට මුහුණලා තානායමකට හෝ සංචාරක නිවාසයකට ඉතාමත් සුදුසු පරිසරයක පිහිටි, ව්‍යාපාරික ගොඩනැගිලි සහිත (30 අවුරුදු රජයේ බදු ඉඩම) ප්‍රමාණයෙන් හෙක්ටයාර්ස් බිංදුවයි දශම හතරයි බිංදුවයි පහ (හෙක්. 0.405) ක් *නොහොත්* අක්කර එකකින් (අක්කර 01, රූඩ් 0, පර්චස් 0) යුත් ඉඩම මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින්,

2007.09.06 වැනි දින පෙ. ව. 11.00ට දේපළ පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*රජයේ ගැසට් පත්‍රයේ* 2006.03.17 දින ද, දිනමිණ, ඩේලි නිවුස් හා තිනකරන් පුවත්පත්වල 2006.01.06 දින ද පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම.*– පොළොන්නරුව සිට හබරණ පාරේ කි. මී. 13ක් පමණ ගිය තැන ප්‍රධාන මාර්ගයට හා ගිරිතලේ වැවට මුහුණලා පාරේ දකුණු පසින් මෙම දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.*– වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

1. ගැණුම් මිලෙන් සියයට දහය (10%)ක්,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට සියයට එකක් (1%)ක්,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් සියයට දෙක හමාරක් (2 1/2%)ක්,
4. ලිපිකරු හා නිවේදන ගාස්තු වශයෙන් රු. පන්සියයක් (500) ක්,
5. විකුණුම් වියදම් සහ වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි 90%ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත පොළොන්නරුව, නවනගරය, මහජන බැංකුව ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය, සහකාර සාමාන්‍යාධිකාරී (උතුරු මැද කලාපය) වෙත ගෙවිය යුතුය.

දුරකථන අංක : 027-2224404/2223900/2225760.
ෆැක්ස් අංකය : 027-2223522.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැකිය.

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කරන ලද මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මිලෙන් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ෂොක්මන් සහ සමරවික්‍රම,
ISO 9001 - 2000 සහතිකය ලත් ශ්‍රී ලංකාවේ
පිළිගත් පුරෝගාමී, වරලත් වෙන්දේසිකරුවෝ,
තක්සේරුකරුවෝ සහ දේපළ ඒජන්තවරු.

*ප්‍රධාන කාර්යාලය* :
අංක 24, ටොරිංටන් පාර,
මහනුවර.
දුරකථන අංක : 081-2227593,
ෆැක්ස් අංකය : 081-2224371,
ඊමේල් : schokmankandy@sltnet.lk.

*නවනගර කාර්යාලය* :
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 05.
දුරකථන අංක : 011-2502680,
ෆැක්ස් අංකය : 011-2585408,
ඊමේල් : schokman@samera1892.com.

08-574

### සීමාසහිත හැටන් නැෂනල් බැංකුව – මෝදර ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කේ. සේනානායක විසින් සහතික කරන ලද්දා වූ ද, සී/ස හැටන් නැෂනල් බැංකුව නමට ලියා සහතික කරන ලද්දා වූ ද 1999.08.26 දින සහ අංක 166 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම වර්ණකුල පටබැඳිගේ ප්‍රේමලාල් බෘනෝ පෙරේරා යන අය ණය කරු හැටියට පැහැර හැර ඇති බැවින්,

සීමාසහිත හැටන් නැෂනල් බැංකුවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල් සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියළුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපල 2007 සැප්තැම්බර් මස 03 වැනි දින පෙ. ව. 11.00 ට මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ අලුත්කුරු කෝරළේ රාගම පත්තුවේ, මැද්දේගොඩ පිහිටි දෙල්ගහවත්ත නමින් හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මානක එස්. බී. ජයසේකර විසින් 1982 ක් වූ සැප්තැම්බර් මස 11 දින මැන සාදන ලද අංක 837 දරන පිඹුර ප්‍රකාරව බෙදා වෙන් කරන ලද ඉඩම වේ.

(විශාලත්වය අ. 0, රූ. 1, පර්. 10)

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2006.02.03 දින රජයේ *ගැසට් පත්‍රය* සහ 2006.02.07 වැනි දින අයිලන්ඩ්, දිවයින සහ තිනකරන් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.*– වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය.

1. ගැණුම් මුදලින් සියයට දහයක් (10%) ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකක් (1%) ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකහමාරක් (2.5%) ද,
4. විකුණුම් සහතික සඳහා මුද්දර ගාස්තු සහ විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදහක් (2,000) ද,
4. ලිපිකරු හා සෝෂක ගාස්තු රුපියල් පන්සියයක් (රු. 500) ද,
5. විකුණුම් වියදම සහ වෙනත් ගාස්තු වෙතොත් එම මුදල ද

වේ.

ගැණුම් මිලෙන් ඉතිරි 90%ක් වූ මුදල වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත සීමාසහිත හැටන් නැෂනල් බැංකුව වෙත ගෙවිය යුතුය. දින 30ක් ඇතුළත ඉතිරි මුදල් නොගෙවුවහොත් ගෙවා ඇති 10% ක මුදල සහ දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා අදාළ ලියවිලි පරීක්ෂා කිරීම සහ වෙනත් තොරතුරු විමසන්න. කළමණාකරු ණය අයකිරීම් හා අධීක්ෂණ අංශය, සීමාසහිත හැටන් නැෂනල් බැංකුව, අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10, දුරකථන අංක : 2661815, 2661816.

රංජිත එස්. මහානාම,
සාම විනිසුරු (මුළු දිවයිනටම),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු,
හා බලයලත් වෙන්දේසිකරු.

ආර්. එස්. එම්. ඔක්ෂන්ස්,
මහානාම ඩ්‍රයිව්,
අංක 474, පිටකෝට්ටේ,
කෝට්ටේ.
දුරකථන අංකය: 2863121.

08-596/1

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.